# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## රවීචන්ද්‍ර පදනම (සංස්ථාගත කිරීමේ)

**රවීචන්ද්‍ර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

මොණරාගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා විසින් 2015 නොවැම්බර් මස 03 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 ඔක්තෝබර් මස 19 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[17 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

**රවීචන්ද්‍ර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"රවීචන්ද්‍ර පදනම" යන සංගමය නීත්‍යානුකූලව සංගමයක් වශයෙන් කොළඹ දී පවත්වාගෙන යෑම නීත්‍යානුකූල කිරීම සඳහා කරනු ලබන පනත් කෙටුම්පතකි. එම සංගමය පිහිටුවාගෙන ඇත්තේ එකී සංගමයේ පරමාර්ථ හා අවශ්‍ය කටයුතු කරගෙන යාම සඳහා එම සංගමයේ සාමාජිකයින් විසින් ගිවිස ගෙන ඇති නීතිරීති අනුවය.

එකී රවීචන්ද්‍ර පදනම පිහිටුවා ගැනීමට අදාළ වූ පරමාර්ථයන් සහ එම සංගමය පිහිටුවා ගැනීමට අදාළ වූ කටයුතු සාර්ථකව ක්‍රියාවේ යොදවා ඇති අතර එය සංස්ථාගත කිරීම සඳහා ඉල්ලා ඇත. මෙම ඉල්ලීම මහජන සුබසිද්ධිය පිණිස හේතු වේ.

කරුණු මෙසේ හෙයින් පහත සඳහන් ආකාරයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ දී මෙසේ පමුණුවනු ලබයි :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2015 අංක දරන රවීචන්ද්‍ර පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

රවීචන්ද්‍ර පදනම සංස්ථාගත කිරීම.

**2.** මෙම පනත ක්‍රියාත්මක කිරීමේ දින සිට ඉන් පසුව "රවීචන්ද්‍ර පදනම" දැනට සාමාජිකත්වය දරන්නන් හා එම සංස්ථාවක් ලෙස ඇතුළත් කරනු ලබන අය මින්පසු සංස්ථාවක් වශයෙන් රවීචන්ද්‍ර පදනම යන නමින් පවත්වාගෙන යනු ලබයි. එකී සංස්ථා නාමය යටතේ සෑම උසාවියක දී ම ඕනෑම නඩුවක් පැවරිය හැකි වනු අතර, පවරනු ලැබිය හැකි ය. එම සංස්ථාව පොදු මුද්‍රාවක් තබා ගැනීමේ බලය හිමිවන අතර, තම කැමැත්ත පරිදි එම පොදු මුද්‍රාව යෙදවීමට හැකි ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** එම සංස්ථාව පිහිටුවීමේ පොදු පරමාර්ථ සහ පහත සඳහන් සේ දැක්විය හැක :—

(අ) හෙළ උරුමයන්, අපගේ අනන්‍ය සංස්කෘතීන් වර්ධනය සහ පෝෂණය කිරීමට අදාළ ආයතනවලට සහය දැක්වීම ;

(ආ) ඉහත 3(අ) ක්‍රියාත්මක කිරීම තුළින් නවෝත්පාදන බිහිකිරීම, නව නිර්මාණ බිහිකිරීම සහ එම ක්ෂේත්‍රයන් තුල ස්වයං රැකියා උත්පාදනය කිරීම සඳහා අදාළ ආයතනවලට සහය දැක්වීම;

(ඇ) ශ්‍රී ලාංකීය සංස්කෘතිය රැකෙන පරිදි කෙරෙන නිෂ්පාදනවලට වෙළඳ පොළේ සාධාරණ මිලක් ලබාදීම තුළින් එම නිෂ්පාදනකරුවන්ගේ වෘත්තීන් ආරක්ෂා කිරීම සඳහා අදාළ ආයතනවලට සහය දැක්වීම;

(ඈ) මතු පරපුරට දායක කිරීම සඳහා දේශීය කලා / සංස්කෘතික නිර්මාණ ආරක්ෂා කිරීම සහ එවැනි ව්‍යාපාරික ප්‍රජාවනට අවශ්‍ය පරිසරය සකස්කර දීම සඳහා අදාළ ආයතනවලට සහය දැක්වීම ;

(ඉ) දේශීය ආර්ථිකය නංවාලීම සඳහා කාබනික පොහොර භාවිතය ආශ්‍රිත කෘෂි ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම එවැනි ව්‍යාපෘතීන්ට ආධාර උපකාර කිරීම සඳහා අදාළ ආයතනවලට සහය දැක්වීම;

(ඊ) ස්වාභාවික විපත් අවස්ථාවල දී අවශ්‍ය සහන සැලසීම සඳහා අදාළ ආයතනවලට සහය දැක්වීම;

(උ) වරප්‍රසාද නොලත් (අඩු පහසුකම් සහිත) ජනතාවගේ අධ්‍යාපන සෞඛ්‍ය, ආර්ථික අංශ නගා සිටුවීම සඳහා ප්‍රාදේශීය හෝ රාජ්‍ය නොවන සංවිධාන / ප්‍රාදේශීය සංවිධාන සමග එක්ව වැඩ කිරීම සඳහා අදාළ ආයතනවලට සහය දැක්වීම ;

(ඌ) වරප්‍රසාද නොලත් (අඩු පහසුකම් සහිත) ශිෂ්‍යයින් සඳහා මුල්‍ය ආධාර සැපයීම සඳහා ආදළ ආයතනවලට සහය දැක්වීම;

(එ) වරප්‍රසාද නොලත් (අඩු පහසුකම් සහිත) තරුණයින් සඳහා වෘත්තීය කාර්මික ආයතන පිහිටුවීම හෝ පවත්වාගෙන යාම සඳහා අදාළ ආයතනවලට සහය දැක්වීම;

(ඒ) අබාධිත සහ අසරණ භාවයට පත් ළමුන් සඳහා ආදරය රැකවරණය සඳහා ආවරණය දෙන ආයතන පිහිටුවීම සහ පවත්නා ආයතනවලට ආධාර කිරීම සඳහා අදාළ ආයතනවලට සහය දැක්වීම;

(ඔ) සෞඛ්‍ය සම්පන්න ජීවන තත්වයක් ගොඩනැගීම සඳහා පාරිසරික පවිත්‍ර කිරීමේ ක්‍රියාකාරකම් සමග සම්බන්ධ වී කටයුතු කිරීම සඳහා අදාළ ආයතනවලට සහය දැක්වීම;

(ඕ) අඩු වරප්‍රසාදලාභී හා රැකියා විරහිත පුද්ගලයන් තුළ පවතින හැකියාවන් හා දක්ෂතාවයන් අනුව රැකියා ලබා ගැනීමට සහය වීම හා අවස්ථාවන් ලබා දීම තුළින් ඔවුන්ගේ ජීවන තත්වය උසස් කර රට තුළ ධරණීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා අදාළ ආයතනවලට සහය දැක්වීම ;

(ක) අඩු වරප්‍රසාදලාභී හා අවශ්‍යතාවයන් ඇති පුද්ගලයන් හට නොමිලේ වෛද්‍ය කඳවුරු, වෛද්‍ය සායන පැවැත්වීම හා නොමිලේ බෙහෙත් ද්‍රව්‍ය බෙදා හැරීම තුළින් අදාළ ආයතනවලට සහය දැක්වීම ;

(ග) ශ්‍රී ලංකාවේ වරප්‍රසාද නොලත් (අඩු පහසුකම් සහිත) ජනතාවට උපකාර කිරීමට සඳහා විදේශීය පාර්ශ්වයන් හෝ සංවිධාන සමග එක්ව කටයුතු කිරීම සඳහා අදාළ ආයතනවලට සහය දැක්වීම ;

(ජ) සංස්ථාවේ පරමාර්ථයන් මුදුන්පත් කර ගැනීමේ අදහසින් ප්‍රදර්ශන, දේශණ, සම්මන්ත්‍රණ, සාකච්ඡා, වැඩමුළු සහ වෙනත් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම හා එවැනි පොත්, සඟරා, පත්‍රිකා හා පුවත් පත් මුද්‍රණය කිරීම, ප්‍රකාශ කිරීම සහ බෙදා හැරීම ; සහ

(ච) ඉහත කී පරමාර්ථ සියල්ල හෝ එක් පරමාර්ථයක් සිදු කිරීම සඳහා අවශ්‍ය විය හැකිවන එවැනි අනෙක් සියලුම ක්‍රියාවන් සිදු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානයන්ට යටත්ව චංචල හෝ නිශ්චල දේපල අත්පත් කර ගැනීමේ සහ රඳවා ගැනීමේ බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ අවසන් කිරීම් ද, ඇපයක් සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම හෝ එකතු කිරීමේ, මුල්‍ය ප්‍රදාන, ආධාර ලබාගැනීමේ හෝ එකතු කිරීමේ ද, ස්වකීය මුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ අයත් ඕනෑම ඉඩමක ඕනෑම ගොඩනැගිල්ලක් හෝ ආකෘතියක් ස්ථාපිත කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථය ඉටුකර ගෙන යාම සඳහා අවශ්‍ය නිලධාරීන් සහ සේවකයන් බඳවාගැනීමේ, සේවයේ නියුක්ත කරවීමේ සහ සේවයෙන් අස්කිරීමේ බලපත්‍ර ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ අතුරෙන් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු

කිරීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන සියලු ක්‍රියා, කාරණා සහ දේවල් ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු මෙම පනතෙහි අනෙකුත් විධිවිධාන සහ සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව සභාපති, උප සභාපති, කළමණාකාර අධ්‍යක්ෂ, ලේකම් හා භාණ්ඩාගාරික සහ සංස්ථාවේ රීතිවලට යටත්ව උපරිම වශයෙන් හත්දෙනෙක් දක්වා වූ අධ්‍යක්ෂවරුන්ගෙන් තෝරාපත් කරගත් අධ්‍යක්ෂ මණ්ඩලයකින් (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මගින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම වරට අධ්‍යක්ෂක මණ්ඩලය මෙම පනත ආරම්භ වන දිනයට ආසන්න වශයෙන් පෙරාතුවම වූ දිනයේ දී ධුරය දැරූ සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලයක් සංස්ථාවේ රීතීන්ට අනුකූලව අධ්‍යක්ෂක මණ්ඩලයක් තෝරා පත් කර ගන්නා තෙක් රැඳී සිටිය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) මෙම පනතේ විධිවිධානවලට අනුකූල නොවන රීතියක් පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් යම් කරුණක් සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කරගැනීමට සහ එහි කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් අදාළ වන වෙනත් ඕනෑම කරුණක් මහ සභා රැස්වීමක දී සහ සාමාජිකයන් 2/3 ක ට නොඅඩු බහුතර ඡන්දයකින් කලින් කලට සංස්ථාව විසින් සාදනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය:—

(අ) සාමාජිකත්වය වර්ගීකරණය සහ සාමාජික ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම හෝ සාමාජිකත්වයෙන් නෙරපීම;

(ආ) අධ්‍යක්ෂ මණ්ඩලයට සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සහ ඔවුන්ගේ බලතල හා කාර්යයන්;

(ඇ) නිළධාරි මණ්ඩලය තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ සේවා ලබා දීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, සේවය හැරයාම හෝ සේවයෙන් ඉවත් කිරීම හා ඔවුන්ගේ බලතල සහ කාර්යභාරයන්;

(ඇ) සංස්ථාවේ රැස්වීම් කැඳවීමේ දී අනුගමනය කළ යුතු සහ එම රැස්වීම්වල කටයුතු කිරීමෙහිලා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය සහ ගණපූරණය;

(ඉ) අරමුදල් ඇතුළුව සංස්ථාවේ දේපළ පරිපාලනය හා කළමනාකරණය.

(2) සංස්ථාව මගින් සාදනු ලැබෙන ඕනෑම රීතියක් වෙනස් කිරීම, අලුතින් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම රැස්වීමක හා එවැනි උපවගන්ති (1) යටතේ සාදනු ලැබූ රීතියක් මෙන් කළ හැකි ය.

(3) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

*සංස්ථාවේ අරමුදල.*

**7.** (1) සංස්ථාවට තම සතු අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, රික්තවරණ, පැවරීම්, පරිත්‍යාග, දායක මුදල් අන්තිම කැමති පත්‍රයෙන් බැහැර කිරීමක්, ගාස්තු පරිත්‍යාග සඳහා වන ප්‍රදාන හෝ වෙනත් ආකාරයකින් ලැබෙන දායකත්වයන් ආදී දේශීය හෝ විදේශීය පුද්ගලයින්, සාමාජිකයන් හා සාමාජිකයන් නොවන තැනැත්තන්ගෙන් ලැබීම යනාදී වශයෙන් මේ දක්වා හෝ මින් මතු භාරගනු ලබන සියලුම මුදල්.

(2) ලැබෙන සියලුම මුදල් සංස්ථාවේ නමින් එක් බැංකුවක හෝ බැංකු කිහිපයක තැන්පත් කළ යුතු අතර මණ්ඩලය තීරණය කරනු ලබන ඕනෑම සුදුසු ආකාරයකින් ආයෝජනය කළ හැකි ය.

(3) සංස්ථාවේ බලතල, කාර්යභාරය සහ ඊට අදාළ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටුකිරීමේ දී සංස්ථාව විසින් දරන ලද සියලුම වියදම් සංස්ථාවේ අරමුදල් මගින් ගෙවනු ලැබිය යුතු ය.

*සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය.*

**8.** මෙම පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමයෙහි පැවති සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනම සංගමයට ගෙවිය යුතුව තිබූ සියලු ණය, දායක මුදල් හා පරිත්‍යාග මෙම පනතේ අරමුණු සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

*සාමාජිකයන්ගේ බැරකම් සීමා කිරීම.*

**9.** සාමාජික ගාස්තු වශයෙන් සාමාජිකයකුගෙන් අය විය යුතු මුදල් ඉක්ම වූ කිසිදු මුදලක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්ය සඳහා හෝ වෙනත් යම් කාර්යයන් සඳහා ගෙවීමට කිසිදු සාමාජිකයකු යටත් නොවන්නේ ය.

**චංචල හා නිශ්චල දේපලවල බලය.**

**10.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපල බැහැර කිරීමක්, භාරයට පත් කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ චංචල හෝ නිශ්චල දේපලක් භාරයේ තබා ගැනීමට නීතියෙන් සංස්ථාවට හැකිවන අතර, මෙම පනතේ පරමාර්ථයන්ට අනුව සංස්ථාව සතු ඒ සියලු දේපල විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට සහ භාරයේ පවතින අවස්ථාවක දී භාරකාර මණ්ඩලයක් මගින් සපයන ලද ආකාරයෙන් කටයුතු කිරීමටත් පූර්ණ බලය ඇතිව සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව මේ පනතින් කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව.**

**11.** සංස්ථාවේ මුද්‍රාව සංස්ථාව විසින් තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව බලය පවරනු ලැබූ පුද්ගලයින් සංඛ්‍යාවක් ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයක් වෙනුවෙන් භාවිතා නොකළ යුතු යි. ඔවුන් තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, එය සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

**ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

**12.** මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

**13.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.